# 1 වන කොටස :
# ඔබ ආරම්භ කරන්නේ
# කොතැනින්ද?



# කොටස - 1 : ඔබ ආරම්භ කරන්නේ කොතැනින්ද?

ඔබ බලශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමට අදහස් කරන සමාගම් කළමනාකරුවෙකු පෙර නිෂ්පාදන කාර්‍යමණ්ඩලයේ සේවකයකු වේද? එසේ නොමැති නම් ඔබ ආයතනවල බලශක්ති දියුණු කිරීම සඳහා සමාග ම්වලට ආධාර කරන පිටස්තර ආයතනයක් ද ? එසේ නම් එය කළයුත්තේ කෙසේද යයි දැනගැනීමට පහත සඳහන් උපදෙස් මාලාව බලන්න.

සීඩීරොම් (CD-ROM) හෝ වෙබ් අඩවියේ “පටන් ගැන්ම කොතැනද?” (ආරම්භය) යන කොටස වෙතට ඔබ පැමිණි විට පහත පෙන්නුම් කර ඇති කොටස දිස්වේ.




## සමාගම් කළමනාකාරිත්වය

සමාගම් අධ්‍යක්‍ෂකවරයෙකුගේ, උසස් කළමනාකරුවෙකුගේ හෝ අතරමැදි කළමනාකරු වශයෙන් ඔබ සැමවිටම ඔබ සමාගම දියුණු කිරීමෙහි නියුක්ත වනු ඇත. දියුණු කිරීමට අදහස් කරණු ඇත.



බලශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමෙන් පහත දැක්වෙන ආකාරයෙන් ඔබ ආයතනයට උපකාරවනු ඇත.

- බල ශක්ති සහ නිපැයුම් මිල අඩු කිරීම
- පරිසරයේ දියුණුව සහ හරිතාගාර වායු පිටවීම් අඩු කිරීම
- බලශක්ති මිළ වැඩිවීම් සහ බලශක්ති ඌනතාවයන් සඳහා වූ අවස්ථාවක් අඩු කිරීම
- පරිසරයට මුල් තැන දෙන නව පාරිභෝගිකයින් (Customers) බිහි කිරීම

මෙම උපදෙස් ඔබට ඉතාමත්ම ප්‍රයෝජනවත් විස්තරවේ.

- සමාගම් බලශක්ති කාර්යක්‍ෂමතා ක්‍රමය පියවර සයකින් (6) බලශක්ති කාර්යක්‍ෂම වීම සඳහා (2 වෙනි කොටස බලන්න)
- 40 කට වැඩි සමාගම් කෙසේ බලශක්ති කාර්යක්‍ෂමතා වර්ධන ආරම්භ කිරීම් වලින් පල ප්‍රයෝජන ලබා ගැනීම කළේ කෙසේදැයි කරන ලද හැදෑරීම් (5 වෙනි කොටස බලන්න)
- බලශක්ති කාර්යක්‍ෂමතාව වර්ධනයට ආධාර කළ හැකි සැපයුම්කරුවන් , උපදේශකයින්, පර්යේෂණ ආයතනයන්, CP කේන්ද්‍රයන් සබැදි ආයතනයන් සහ රජයේ ආයතනයන් වැනි පුද්ගලයින් හා ආයතනවල දත්ත (www.energyefficiencyasia.org බලන්න)

ඔබ පටන් ගත යුත්තේ කොතැනින්ද ?

- ඔබ ආයතනයේ බලශක්ති ගණනය සඳහා කළමනාකාරිත්වය හා අදාල සේවකයින් අතර රැස්වීමක් සැලසුම් කිරීම (2 වන කොටසේ පියවර ක්‍රමවලින් 1 බලන්න)
- බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා ඉදිරිපත් කරන හොඳ අදහස් සඳහා දිරිගැන්වීමේ දීමනා සහ අදාල පිලිගැනීම් ක්‍රමයන් ආරම්භ කිරීම
- නිෂ්පාදන සේවකයින් වෙත මෙම උපදෙස් මාලාව ලබා දීම.
- ඔබගේ විස්තර බලශක්ති දත්ත පදනම් යොමුවට (Energy Contact Database) ඇතුළු කිරීම (www. energyefficiencyasia.org)

## නිෂ්පාදන සේවකයින්



ඔබ බොයිලේරු ක්‍රියාකරුවෙකු, නඩත්තු සේවකයෙකු හෝ යාන්ත්‍රික / විදුලි ඉංජිනේරුවරයෙකු විය හැක. නිෂ්පාදන සේවයේ නියුක්ත වන්නෙකු ලෙස ඔබට බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීම සඳහා කළ හැකි දෑ කිහිපයක් ඇත. ඔබට උපකාරවීම සඳහා,

- කළමනාකරණයේ පිලිගැනීම ලබා ගෙන ඔබගේ රැකියා ස්ථාවරත්වය වර්ධනය කර ගන්න.
- ඔබ සමාගමට (ආයතනයට) අවශ්‍ය හැකියාවන් වර්ධනය කර ගන්නා අතර අනෙකුත් සමාගම් වලින්ද ඇති අවශ්‍යතාවයන් සපුරාගන්න.
- සේවා ස්ථානයේ කාර්යයන් සඳහා වූ රක්ෂිත සහ සනීපාරක්ෂාව සඳහා වන අවශ්‍යතා සපුරාගන්න.

මෙහි ඔබට ඉතාමත් ප්‍රයෝජනවත් විස්තර අඩංගුය ඃ

- ඔබගේ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල තාක්ෂණික විස්තර, බලශක්ති උපකරණ භාවිතය සඳහා පුහුණු කිරීමේ විස්තර පත්‍රිකා (කොටස් 3 සහ 4 බලන්න)
- ඔබ ආයතනයේ බලශක්ති කරණ සහ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල අනෙකුත් සමාගම්වලින් කරන ලද හැදෑරීම් (කොටස 5 බලන්න)
- ක්‍රියාවලි ලයිස්තුව වැඩ විස්තර කල බලශක්ති උපකරණ සඳහා වූ බලශක්ති කාර්යක්ෂමතාව දියුණු කිරීම (4 වෙනි කොටස බලන්න)

ඔබ පටන් ගන්නේ කොතැනින්ද ?

- වැඩ ක්ෂේත්‍රයේ පාවිච්චි කරන බලශක්ති ප්‍රමාණය සොයන්න.
- ඔබගේ කළමනාකරු හා එතන වැඩ කරන සේවකයින් සමග බලශක්ති කාර්යක්ෂමතාව ගැන සාකච්ඡා කරන්න.
- බලශක්ති ඉතිරි කිරීමේ ක්‍රම සඳහා වැඩ ක්ෂේත්‍රයේ සෙවීම් කරන්න.

## රජය



නොයෙකුත් ජාතික, පලාත් හෝ ස්වදේශීය රජයේ ආයතන විසින් බලශක්ති පරිභානිය වැලක්වීම සඳහා කර්මාන්ත, පරිසර හා බලශක්තිය හෝ ආර්ථිකය සබැඳීම ගාන කටයුතු කිරීමට කැමැත්තක් දක්වයි.

මේ සම්බන්ධව රජයේ ආයතනයන් වශයෙන් පහත සඳහන් දෑ කල හැකිය.

- මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීම. මෙය කල හැක්කේ බලශක්තිය වෙනුවෙන් වන වියදම් අඩු කිරීමෙනි.
- වෙනත් රටවලින් බලශක්ති සැපයුම් මිලදී ගැනීම අඩු කිරීම. තෙල් වැනි දෑ අඩු කිරීමෙන් රටෙහි GDP වෙත බර අඩු කර ගත හැක.
- තාපය සහ උෂ්ණත්වය ගෙන දෙන වායු අඩු කර දේශගුණය වෙන්වීම් වැලැක්වීම.

මෙම උපදෙස් වලට ඔබට ඉතාමත්ම ප්‍රයෝජනවත් විස්තර

- බලශක්ති කාර්යක්ෂමතා සමීක්ෂණ , ජාතික හා ප්‍රාදේශීය බාධක ඇතුලුව තවද රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ යෝජනා කළ හැකි විසඳුම්ද සමග. (5 වන කොටස බලන්න)
- බලශක්ති කාර්යක්ෂමතා හැදෑරීම් , ආසියා පැසිෆික් කලාපයන්හි සමාගම් වලින් කර ඇති හැදෑරීම් අනුව (5 කොටස බලන්න)
- තොරතුරු දත්ත පදනමක් (Contact Database) , ව්‍යාපෘති තොරතුරු (GERIAP ව්‍යාපෘතිය ඇතුලුව) සහිත
- රජයේ බලශක්ති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා උදව් කල හැකි ආයතන සබැඳිව යොමු විස්තර අඩංගු දත්ත පදනම් යොමුවක්.

ඔබ පටන් ගන්නේ කොතැනද ?

- කර්මාන්ත වෙත බලපාන ආයතන අතර මෙම උපදෙස් බෙදා හැරීම හා සැපයීම.
- පරිසරය සහ ව්‍යාපාරයනට යෝග්‍ය බලශක්ති කාර්යක්‍ෂමතා බලශක්ති සැකසීම.
- පරිසර ප්‍රතිපත්ති හා ආර්ථික ප්‍රතිපත්ති සමග බලශක්ති ප්‍රතිපත්ති සමගාමී කිරීම.
- ඔබගේ යොමු විස්තර බලශක්ති දත්ත පදනම් යොමුවට ඇතුලත් කිරීම

## පහසුකම් සපයන්නන්



බලශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීම තනිව සමාගම විසින් කල නොහැක. නොයෙකුත් ආයතන මේ සදහා පහසුකම් සැපයීමෙන් සමාගම් වෙත උදව් කල හැක. කර්මාන්ත සමාග ම්, පර්යේෂණ ආයතන, උපදේශකයින්, පිරිසිදු නිෂ්පාදන කේන්ද්‍ර, විශ්ව විද්‍යාල, වානිජ මණ්ඩල ඇතුලු රජයේ නොවන ආයතන මෙවැනි උදව් සැපයිය හැකි ආයතන වේ.

බලශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමට සමාගම් වෙත උදව් ලබා දීමෙන් ඔබට ඃ

- වියදම් අඩු කිරීමටද බලශක්ති මිල ඉහල යෑමට ඇති බලපෑම් අඩු කිරීමටද උදව් දීම.
- පුද්ගලයෙකු හා ආයතනයක් වශයෙන් හැකියාවන් හා පළපුරුද්ද වැඩි දියුණු කිරීම.
- හරිතාගාර වායු පිටවීම් අඩු කිරීමෙන් පරිසර ආරක්‍ෂා කිරීම.

ඔබට අවශ්‍ය කාර්මාන්ත සදහා වූ බලශක්තිය කාර්යක්‍ෂමතා පහසුකම් සැපයීමේ තොරතුරු මෙම උපදෙස් වලට අඩංගුය. ඔබට අවශ්‍ය ඉතාමත්ම වැදගත් හා ප්‍රයෝජනවත් තොරතුරු නම් ඃ

- සමාගම් සදහා බලශක්ති කාර්යක්‍ෂමතා මෙහි ඇත. පියවර සයකින් (6) කින් සමන්විත වූ එම ක්‍රමවේදය වඩා බලශක්ති කාර්යක්‍ෂමවීම කේසේ කළ යුතුදැයි පෙන්නුම් කරයි. (2 වන කොටස බලන්න)
- එම ක්‍රමවේදය ආවරණය වන පුහුණු කිරීම් සම්බන්ධ පොත් පත් - පරිච්ඡේද සහ විදහා දක්වන රූප (ස්ලයිඩ්), බලශක්ති උපකරණද එම උපකරණ වල ක්‍රියාකාරීත්වය සහ අදාල කර්මාන්ත ක්ෂේත්‍රයන්හි විස්තර මෙහි දක්වා ඇත. (5 කොටස බලන්න)
- තොරතුරු දත්ත යොමුවක්ද මූල්‍ය විසදුම් සදහා උපදෙස්ද සමාගම් 40 කට වැඩි හැදෑරීම් මෙහි අඩංගු වේ. (5 වන කොටස බලන්න)

ඔබ පටන් ගන්නේ කොතැනද ?

- මෙම උපදෙස් බලා ඒ අනුව බලශක්ති කාර්යක්‍ෂමතාවය ඉහල දැමීමට කර්මාන්තයට උදව් වන්නේ කෙසේදැයි දැනීමක් ලබා ගන්න.
- අවශ්‍යතා පෙන්නුම් කරන සමාගම් තෝරා බලා මෙම උපදෙස් වලට අඩංගු පුහුණු කිරීමේ ද්‍රව්‍ය සහිත පාඨමාලා සකසන්න ක්‍රියාත්මක කරන්න.
- බලශක්ති කාර්යක්‍ෂමතාව ගැන හොද දැනීමක් සමාගම් කළමනාකාරීත්වයේ බිහි කරන්න. ඔවුන් බලශක්ති සමීක්‍ෂණයට යොමුකර ඔවුන් වෙත මෙහි අඩංගු සමාගම් බලශක්ති කාර්යක්‍ෂමතා ක්‍රමවේදය කෙසේ උපකාර වන්නේදැයි පැහැදිලි කරන්න.
- ඔබට සැපයිය නොහැකි උපදෙස් ලබා ගැනිම සදහා සමාගම් වෙනත් මූල්‍ය ආයතන සැපයුම්කරුවන් සහ වාණිජ මණ්ඩල වෙත යොමු කරන්න. මේ සදහා යොමු දත්ත පදනම් (Contact Database ) උපයෝගි කර ගන්න.
- ඔබගේ යොමු විස්තර බලශක්ති යොමු දත්ත පදනමට (Contact Database ) ඇතුලත් කරන්න.

## මූල්‍ය ආයතන



විශල ව්‍යාපෘති පදනම් සමාගම් මූල්‍ය ආධාර ලබා ගැනිමට වානිජ බැංකු සහ බලශක්ති සේවා සමාගම් (ESCOs) වෙත ඇදීයාම නිතර රට තුළ සිදුවේ. ඔබ මූල්‍ය ආයතනයක් නම් එවැනි සමාගම් වලට මුදල් ආයෝජනය කිරීමෙන් ඔබට බලශක්ති කාර්යක්‍ෂමතාවය දියුණු කිරීමට උදව් කළ හැක.

- මූල්‍ය ස්ථාවරත්වයන් සහ ණය ලබා ගැනීමේ හැකියාවන් දියුණු කිරීමට සමාගම් වෙත ඔබගේ අනාගත ගැණුම්කරුවන් වශයෙන් උදව් ලබා දීම.
- ආයෝජනය සදහා වැඩි ඵල ප්‍රයෝජනයක් බලශක්ති ව්‍යාපාතිවලින් / සමනිෂ්පාදන වැනි ක්‍රමවලින් (ක්‍රම භාවිතා කර) ලබා ගැනිම.
- මූල්‍ය නිෂ්පාදන තත්වය වැඩිදියුණු කිරීමෙන් ගැණුම්කරු පදනම් දියුණු කිරීම.
- ඔබ ආයතනයේ පිළිරුව මහජන දැක්ම ඉදිරියේ දියුණු කර ඒ සමග පරිසරය සුරැකීම සදහා ඔබගේ සහය විදහා දැක්වීම .

මෙම උපදෙස් වලට අඩංගු ඔබට ඉතා වැදගත් ප්‍රයෝජනවත් තොරතුරු ඃ

- බලශක්ති කාර්යක්ෂමතා සහ පිවිතුරු නිෂ්පාදන ව්‍යාපෘති සඳහා මූල්‍ය ආධාර ලබා දෙන මූල්‍ය ආයෝජන ආයතන වෙත අවශ්‍ය අවි (5 වන කොටස)
- බලපැවති ව්‍යාපෘති සහ අවශ්‍ය මුදල් ආයෝජන - ඵල ප්‍රයෝජන ගැන දැන ගැනීම සඳහා ආසියා පැසිෆික් කලාපයන්හි සමාගම් වලින් කර ඇති බලශක්ති කාර්යක්ෂමතා හැදෑරීම. (5 වන කොටසබලන්න)
- රජයේ ආයතන සහ සැපයුම් ආයතන වැනි මූල්‍ය ආධාරක සහ වෙනත් ආයතන සබැඳීම සකසන ලද තොරතුරු යොමු දත්ත පද්ධතියක් (5 වන කොටස බලන්න)

ඔබ පටන් ගන්නේ කොතැනද ?

- උපදෙස්වල අඩංගු අවි සහ හැදෑරීම් ගැන අවබෝධයක් ලබා ගෙන බලශක්ති කාර්යක්ෂමතාව ව්‍යාපෘති විමර්ශණය කිරීමේ හැකියාවන් දැනගන්න.
- දැනට විවෘත මූල්‍ය ආධාර යන්ත්‍ර ගැන සමාගම් (වලට දැනුම් දෙන්න) දැනුවත් කරන්න.
- විශ්වාසය තැබිය හැකි බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘති සඳහා සමාගම්වලට ආධාර සැපයීම.
- බලශක්ති සහ පරිසරය සඳහා සලකා බැලීමට මූල්‍ය ආයෝජන පුලුල් කිරීම
- සංවර්ධන වායු පිටවීම් සහ පරිසරය ඇතුලත් බලශක්ති සහ වෙනත් සැළකීම් වෙනුවෙන් වූ නව මූල්‍ය ආධාර සැළසුම් සංවර්ධනය කිරීම.
- ඔබගේ යොමුව බලශක්ති යොමු දත්ත පද්ධතියට ඇතුලත් කරන්න.

## ගැණුම්කරුවන්



සමාගම්වල ගැණුම්කරුවන්, නිෂ්පාදකයින් වශයෙන් හෝ වාහන නිපදවීම, යකඩ භාණ්ඩ සහ කඩදාසි විකිණිම, සිල්ලර බඩු විකිණීම, පාරිභෝගිකයින් හෝ ඉදිකරන්නන් වශයෙන් හෝ කටයුතු කිරීම සිදුවනු ඇත. එවැනි ගැණුම්කරුවන් වශයෙන් ඔබගේ සැපයුම්කරුවන් දිරිග ැන්වීමෙන් ඔබට බලශක්ති කාර්යක්ෂමතාවය දියුණු කිරීම කළ හැක.

- බලශක්ති සුරැකුම් මිල අඩු භාණ්ඩ මිල ඇතුලත් කිරීමෙන් භාණ්ඩ මිලයට ගැනීමේදී මිල අඩු කර ගැනීම (බලශක්ති සුරැකුම් මිල අඩු කිරීම)
- ඔබගේ සැපයුම්කරුවන් පරිසරය දියුණු කිරීම වෙත යොමු කර ඔබගේ ප්‍රතිබිම්බය (කීර්ති නාමය) සුරැකීමට දියුණු කිරීම.

මෙම උපදෙස්වල අඩංගු ඔබට ඉතා වැදගත් ප්‍රයෝජනවත් තොරතුරු ඃ

- ඔබගේ සැපයුම්කරුවන් බලශක්ති කාර්යක්ෂමවීම සඳහා උපකරණ සමාගම් බලශක්ති කාර්යක්ෂම ක්‍රමවලිය.
- බලශක්ති කාර්යක්ෂම කිරීමට ඉදිරිපත් වීම නිසා ඵලප්‍රයෝජන ලබන ලද 40 කට වැඩි සමාගම් සඳහා වූ හැදෑරුම් වාර්තා. (5 වන කොටස බලන්න)
- බලශක්ති කාර්යක්ෂමතා වර්ධනය සඳහා ඔබගේ සැපයුම්කරුවන් ආධාර කළ හැකි උපදේශකයින්, පර්යේෂණ ආයතනයන්, CP කේන්ද්‍ර, සබැඳි ආයතනයන් සහ රජයේ ආයතන ඇතුලත් යොමු දත්ත පද්ධතියක්. (5 වන කොටස සහ www.energyefficiencyasia.org)

ඔබ පටන් ගන්නේ කොතැකද ?

- ඔබගේ සැපයුම්කරුවන්ගේ අවධානයට මෙම උපදෙස් යොමු කරන්න.
- පරිසරය සහ බලශක්තිය සම්බන්ධ සැලකීම් ඔබගේ මිලදී ගැනීම් ප්‍රතිපත්ති වලට අන්තර්ගත කරන්න.
- භාණ්ඩයේ මිලෙහි කොපමණ ප්‍රමානයක් බලශක්තිය වෙනුවෙන් වැය වන්නේ දැයි යන්න ගැන ඔබගේ සැපයුම්කරුවන්ගෙන් විමසා එම සැපයුම්කරුවන් බලශක්ති කාර්යක්ෂමවීම සඳහා යොදා ඇති ක්‍රම ගැනද විමසන්න.

## සැපයුම්කරුවන්



සැපයුම්කරුවන් සමාගම් වෙත අමු ද්‍රව්‍ය, බලශක්ති, උපකරණ, ඇසුරුම් ද්‍රව්‍ය නඩත්තු සේවා සහ ප්‍රවාහන සේවා සපයනු ලැබේ. අඩු ප්‍රමිති භාණ්ඩ සහ සේවා උපයෝගි කිරීම නිසා නිතර වැඩි බලශක්ති මිල ගෙන දෙන බව (GERIAP) ව්‍යාපෘතියේ එක් සොයා ගැනීමකි. මෙයට උදාහරණ වශයෙන් බාල ගල් අඟුරු, අකාර්යක්ෂම වාෂ්පීකරණයන් සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අනිසි ලෙස භාවිතා කරන වායු පීඩන යන්ත්‍ර දැක්විය හැක.

සැපයුම්කරුවන් වශයෙන් ඔබගේ කර්මාන්ත ගැණුම්කරුවන් වෙත සහය දීමෙන් ඔබ ඃ

- ගැණුම්කරුවන්ගේ මුදල් ඉතිරි කිරීමේ හේතුවෙන් වැඩි කලක් එම ගැණුම්කරුවන් පවත්වාගෙන යාම.
- නව ගැණුම් සමග වැඩි සම්බන්ධකම් වර්ධනය කිරීම.
- ඔබගේ නිපැයුම් ද්‍රව්‍ය සඳහා වැඩි මිලක් ඉල්ලුම් කිරීම. ඔබගේ ගැණුම්කරුවන් බලශක්ති කාර්යක්‍ෂම කිරීම තුලින් මිල ආපසු උපයාගැනීම හේතුවෙන් එය ඔබට කල හැක.

මෙම උපදෙස්වල අඩංගු ඔබට ඉතා වැදගත් / ප්‍රයෝජනවත් තොරතුරු ඃ

- සමාගම් සහ කර්මාන්ත භාවිතාකරන බලශක්ති උපකරණ සදහා තාක්‍ෂණික තොරතුරු සහ පුහුණු කිරීම් ද්‍රව්‍ය (3 වන කොටස)
- ඔබගේ ගැණුම්කරුවන් වෙත බලශක්ති කාර්යක්‍ෂම කිරීම සදහා අවශ්‍ය උදාහරණ ඇත. සමාගම් 40 කට වැඩි සංඛ්‍යාවකට අදාල හැදෑරීම් වාර්තා .(5 වන කොටස බලන්න)
- බලපෑම්වලට හේතුවන කර්මාන්ත සමාගම්, උපදේශකයින්, පර්යේෂණ ආයතන, CP කේන්ද්‍ර, රජයේ ආයතන වැනි සමාගම් සහ ආයතන ඇතුලත් යොමු දත්ත පද්ධතියක්. (5 වන කොටස සහ www. energyefficiencyasia.org)

ඔබ පටන් ගන්නේ කොතැනද ?

- ඔබගේ යොමුව බලශක්ති යොමු දත්ත පද්ධතියට ඇතුලත් කරන්න. (www.energyefficiencyasia.org)
- මෙම උපදෙස් ඔබගේ සැපයුම්කරුවන්ගේ (ගැණුම්කරුවන්ගේ අවධානයට සහ ඔබ ආයතනයේ අවධානයට යොමු කරන්න.
- බලශක්ති කාර්යක්‍ෂමතාව ගැන හොද දැනීමක් ඔබගේ සමාගමේ කළමනාකාරීත්වයේ ඇති කර ඒ සම්බන්ධව ඔබට කුමණ ආකාරයෙන් උපකාර වියහැකි දැයි පෙන්නුම් කරන්න. ඔබ ආයතනයේ නිපැයුම් භාණ්ඩ සහ සේවා තුළින් බලශක්ති කාර්යක්‍ෂමතාව වර්ධනය කිරීම ගැන පැහැදිලි කරන්න.